**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012**
**2014 අප්‍රේල්/ මැයි/ ජූනි**

**සමාජීය විද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය - MACO - E 3015**

**මාධ්‍ය ආචාරධර්ම, මහජන සම්බන්ධතාව හා දැන්වීම් කලාව**

**<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

**<u>එක්කෝ</u>**

01. (අ) ''මාධ්‍ය ආචාරධර්ම වඩාත් හොඳින් ක්‍රියාත්මක වන්නේ සමාජීය ආචාරධර්ම අගයන ජන සමාජයකය.'' මෙය හඳුන්වා දෙන්න.

**<u>නැතහොත්</u>**

(ආ) මාධ්‍ය නීතියට වඩා මාධ්‍ය ආචාරධර්මයන්හි තිබෙන ප්‍රායෝගික වැදගත්කම පැහැදිලි කරන්න

02. දැන්වීම්කරණය හා මහජන සම්බන්ධතාව යනු අලෙවිකරණය හා බැඳුණු මූලික විෂය ක්ෂෙත්‍රයන්ය.'' න්‍යායාත්මක හා ප්‍රායෝගික කරුණු ඇසුරින් විග්‍රහ කරන්න.

03. ''නූතන දැන්වීම්කරණය සහ මහජන සම්බන්ධතාව අලෙවිකරණය මෙන්ම ආයතනික කළමනාකරණය හා සම්බන්ධ වරලත් වෘත්තීය විෂය ක්ෂේත්‍රයකි. '' උදාහරණ සහිතව විස්තර කරන්න.

04. **''20 වන සියවස ආරම්භ වන්නේ එකවර විශාල ජනකායක් ප්‍රලෝභනය කරනු ලබන බහු ජන මනෝවිද්‍යාවකිනි.''** - එඩ්වඩ්. එල්. බර්නීස්

ප්‍රචාරණය හා මහජන සම්බන්ධතාව නූතන ජන සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය ඇසුරින් ඉහත ප්‍රකාශය විග්‍රහ කරන්න.

05. ''විවිධ සංදර්භ මෙන්ම ආයතනයන් හා බැඳෙමින් විවිධ පාර්ශවකරුවන්ට අදාළව මහජන සම්බන්ධතාව පුළුල්ව ක්‍රියාත්මක වේ.'' එකිනෙකට වෙනස් මහජන සම්බන්ධතා ක්ෂෙත්‍ර පිළිබඳ විස්තරයක් කරන්න.

06. තෝරාගන්නා ලද විෂය ක්ෂෙත්‍රයකට අදාළව ක්‍රමෝපායික මහජන සම්බන්ධතා සැලැස්මක් නිර්මාණය කරන්න.

07. ''ප්‍රකාශන නිදහස සහ වාරණය යනු ප්‍රායෝගිකව ගත්විට ද්විමය ප්‍රතිවිරුද්ධාභාසයක් දක්වන ක්‍රියාවලියකි'' මේ පිළිබඳව ස්වයං ඇගයීමක් කරන්න.

08. නූතන විද්‍යුත් මාධ්‍ය වෙළඳ දැන්වීම්කරණයේ පවතින නිර්මාණාත්මක හා මනෝවිද්‍යාත්මක ප්‍රවණතා මෙන්ම ඒ තුළින් පෙරළා උද්ගත වන ආචාරධර්මීය ගැටළු පිළිබඳව සාකච්ඡාවක් කරන්න.